(13(1) නියෝගය)

10 ආකෘති පත්‍රය

**කාර්මික පතල් කැණීම් බලපත්‍රය**

**ආර්ථික ජීව්‍යතා වාර්තාව - ආකෘතිය හා අන්තර්ගත කරුණු (අ සහ ආ වර්ග සඳහා පමණි)**

ආර්ථික ජීව්‍යතා වාර්තාවක, මෙහි පහත දැක්වෙන විස්තර, පිඹුරු සහ සිතියම් ඇතුළත් විය යුතුය

1. දේපළ පිඹුර - විස්තරය, මායිම් මැනුම
2. සංවර්ධන හා නිෂ්පාදන වැඩසටහන
   - (අ) නිධි ඉතිරිකර තබා ගැනීම
   - (ආ) පතල් කැණීමේ සැලැස්ම - පතලේ ජීව කාලය, වැඩ සටහන, යොදාගන්නා ක්‍රම
   - (ඇ) පිරිසැකසුම් සැලැස්ම - මිලිං, බෙනිෆිසියේෂන්, ෆ්ලෝ චාට්, කාලසටහන් ක්‍රම
   - (ඈ) ටේලිංස්, අපද්‍රව්‍ය පාලනය ඇතුළත්ව පරිසර ආරක්ෂණ සැලැස්ම
   - (ඉ) යන්ත්‍රස්ථානයේ පිහිටීම/පහසුකම් - පිහිටීම් සැලැස්ම,ප්‍රවේශය,ජලය,බලශක්තිය, ඉදිකිරීම (අදාළ අවස්ථාවලදී)
   - (ඊ) පතල් ප්‍රතිසංස්කරණ සැලැස්ම - සැලසුම් නිර්මාණය,ප්‍රගාමී වැඩබිම් පුනරුත්ථාපනය ක්‍රියා පිළිවෙල

යෝජිත පතල් කැණීමේ කටයුතුවල ප්‍රමාණය අනුව, අතිරේක ලිපිගත විස්තර ලබා ගැනීම අවශ්‍යවන බව අධ්‍යක්ෂවරයා නිශ්චය කරන අවස්ථාවලදී මෙහි පහත සඳහන් සියලු තොරතුරු හෝ ඉන් කොටසක් හෝ සපයන ලෙස නියම කරනු ලැබිය හැකිය.

3. අලෙවි කිරීමේ හා විකිණීමේ සැලැස්ම
4. ශුද්ධ ආදායම් විග්‍රහය/මුදල් ලැබෙන ආකාරය පිළිබඳ විග්‍රහය (කැෂ් ෆ්ලෝ ඇනැලිසිස්)
5. ප්‍රාග්ධන පිරිවැය - ඉඩම්, ගොඩනැගිලි, උපකරණ, කාරක ප්‍රාග්ධනය
6. ක්‍රියාත්මක කිරීමේ පිරිවැය - කාර්ය මණ්ඩල, ප්‍රතිලාභ පරිපාලන, නඩත්තු, සෞඛ්‍ය සහ ආරක්ෂාව, පරිසරය, රාජ්‍ය භාග, බදු,බැඳුම්,මුදල්,සැපයුම්, උපයෝගී ද්‍රව්‍ය ප්‍රවාහනය
7. සේවා නියුක්ති හා පුහුණු කිරීමේ වැඩසටහන
8. පාරිසරික බලපෑම අධ්‍යයනය
   - (අ) බේස්ලයින් ඩේටා (ආධාරක දත්ත)
     වඩා මතුපිට හා භූගත ජලය, වාතයේ තත්ත්වය හා ශබ්ද මට්ටම්, ශාක හා සත්ත්ව ජීවය පිළිබඳ නියැදි ගැනීම සහ/හෝ ඒවා විශ්ලේෂණය
   - (ආ) නිෂ්පාදනයේ බලපෑම්
     දැනට පවත්නා ජනාවාස හා වර්තමානයේ ඉඩම් ජලය හා සත්ත්ව සහ ශාක සම්පත් ප්‍රයෝජනයට ගන්නා ආකාරය කෙරෙහි පතල් කැණීමෙන් මෝල් හා යන්ත්‍ර ස්ථානවලින්, ද්‍රව්‍ය ඉවත් කර ගැනීම හා ප්‍රවාහනයෙන්, නිවාස හා කම්කරු වැඩවලින් ඇතිවිය හැකි බලපෑම පිළිබඳ විග්‍රහයක්.
9. සවිස්තර පතල් ප්‍රතිසංස්කරණ සැලැස්ම

   පතල් කැණීම් කටයුතුවල ප්‍රතිඵලයක් වශයෙන් පරිසරය පරිහානියට පත් කිරීමට ඉඩ තිබෙන සහ/හෝ පරිසරයට අන්තරාදායක විය හැකි ජල දූෂණය, වාත දූෂණය, පස දූෂණය, ශබ්දය, පුපුරණ ද්‍රව්‍ය සහ වෙනත් සියලු දේ ආශ්‍රිතව, එම හානිකර බලපෑම් හැසිරවීම, සමීක්ෂණය හා ඒවා ප්‍රගාමීව පාලනය කිරීම හා ඒවාට ප්‍රතිකර්ම යෙදීමේ ක්‍රියා මාර්ග, කාලසටහන් සහ ඇස්තමේන්තු කළ වියදම, මෙහි සඳහන් ප්‍රතිසංස්කරණ වැඩ සම්පූර්ණ කිරීම පිළිබඳ අනුක්‍රමික හා අවසාන කාලසටහන සඳහන් කළ යුතුය.
10. ප්‍රතිසංස්කරණ බැඳුම්කර

    පතල් යථා තත්ත්වයට පත් කිරීමේ ප්‍රතිසංස්කරණ සැලැස්ම විශ්ලේෂණය කර අනුමත කළ පසුව යථා තත්ත්වයට පත් කිරීමේ බැඳුම්කරයට ඇතුළත්වන ලෙස අධ්‍යක්ෂවරයා විසින් නියම කළ හැකිය. බලපත්‍රලාභියා විසින් ප්‍රතිසංස්කරණ සැලැස්මේ විස්තර දැක්වෙන පරිවැය පදනම් කරගෙන බැඳුම්කරයෙන් ඇප විය යුතු මුදල් ප්‍රමාණය ආගණනය කරනු ලැබේ. එම පිරිවැයට නියමිත ඇපයට මෙහි පහත සඳහන් යථා තත්ත්වයට පත් කිරීමේ ප්‍රතිසංස්කරණ කටයුතු එකක් හෝ වැඩි ගණනක් කිරීම සඳහා අවශ්‍ය වාර්ථමාන කම්කරු කුලිය, උපකරණ, සේවා හා සැපයුම් යනාදිය සඳහා ඇස්තමේන්තු කළ වියදම ඇතුළත් විය යුතුය.

    - (අ) ගොඩනැගිලි හා යන්ත්‍රස්ථාන පහසුකම් ඉවත් කිරීම
    - (ආ) පතල් වලවල්, පතස්, ඩික්ලයින් සහ පතල් ළිං කටවල ආරක්ෂිත වැසීම
    - (ඇ) පතල් ප්‍රදේශ (ටේලිං ඒරියා) අධික බෑවුම් සහිත ගල් මුහුණත්, ජලවහන පාලන ප්‍රදේශ ස්ථාපනය කිරීම
    - (ඈ) මතුපිට භූමිය සමෝච්ඡව සැකසීම
    - (ඉ) නැවත වෘක්ෂලතා වැවීම

    පිළිගත හැකි බැඳුම්කරවලට, මුදල්, ජාත්‍යන්තර පිළිගැනීමක් ඇති බැංකුවක ණයවර ලිපියක්, ඇපකරයක් හෝ ගනුදෙනු කළ හැකි වෙනත් බැඳුම්කරයක් හෝ වෙනත් අනුමත කළ ඇප බැඳුම්කරයක් ඇතුළත් විය හැකිය. සැලැස්මේ මූලික අංග හා බැඳුම්කරයේ මුදල අවුරුදු දෙකින් දෙකට සමාලෝචනය කර සංශෝධනය කරනු ලැබීමට නියමිතය.